

ඇසළ සඳ නැඟි රැයේ....

## ඇසළ පොහොයෙන් ඇරැඹෙන පින්බර වස් සමය

– උතුරාවල ධම්මරතන හිමි

වස් විසීම පිළිබඳ ශාසන ඉතිහාසගත කතාව – ඒ පිළිබඳ ගිහි – පැවිදි පිරිසගෙන් ඉටුවිය යුතු සිරිත් විරිත් හා ශාසන සම්ප්‍රදායක් වශයෙන් එහි ඇති වැදගත්කම.

## මා බුදුරදුන් දුටු හැටි

– මුනිදාස කුමාරතුංග

ශ්‍රී ලංකාවේ සිටි සුප්‍රකට භාෂා විශාරදයකු වූද, මහා සාහිත්‍යධරයකු වූ ද කුමාරතුංග මුනිදාසයන් විසින් රචනා කරන ලද – සාහිත්‍ය ප්‍රබන්ධයකි. බුදු ගුණ වර්ණනා කිරීමට දැරූ ප්‍රයත්නයකි.

## බුදු සිරිත

මනහර සිතුවම් සහ ඉංග්‍රීසි – සිංහල කෙටි විස්තර සහිතව ‘බුදු සිරිත’ කොටස් වශයෙන් පාඨකයා වෙත ඉදිරිපත් කැරෙන නව විශේෂාංගයක පළමු වැනි කොටස.

## නිව්යෝක් බෞද්ධ විහාරය

– විල්බට් පෙරේරා

‘සයුරෙන් එහා’ විශේෂාංගය යටතේ ඇමෙරිකාවේ නිව්යෝක් නගරයේ ‘ක්වීන්ස්’ කොටසේ ප්ලෂිං නමැති ස්ථානයේ පිහිටි බෞද්ධ විහාරස්ථානයක් මඟින් ඉටු වන ශාසනික හා සාමාජික සේවා රැසක් පිළිබඳ තොරතුරු.

## දහම වරදවා ගැනීම

– ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි

නූතන යුගයේ විවිධ උගතුන් විසින් බුදු වදනට විවිධාකාරයෙන් අර්ථ සැපයීම නිසා පොදු මහජනතාව අතර දහම පිළිබඳ වැරැදි නිගමන ජනිත වන අයුරු මෙම ලිපියෙන් විමසුමට ලක් කැරේ. බුදුදහම පිළිබඳ සාවද්‍ය මත බිහිවීමට තුඩු දෙන හේතු රැසක් විග්‍රහ කිරීමට දරන උත්සාහයකි.

## වජිරාරාමය

– සීසර් සුදුසිංහ

කොළඹ බම්බලපිටියේ පිහිටි සුප්‍රකට විහාරස්ථානයක් මඟින් ඉටුවන ශාසනික හා සාමාජික මෙහෙවර රැසක් පිළිබඳ ප්‍රවෘත්ති විශේෂාංගයකි.

## ඇසළ පෝදා එළිදුටු ආර්ය ප්‍රතිපදාව

– බී. ඒ. විමලසේන

බරණැස් (වාරාණසී) නුවර – එවකට ඉසිපතන මිගදය නම් වූ ස්ථානයේදී ඇසළ පෝ දිනක බුදුරදුන් විසින් පවත්වන ලද පළමු ධර්ම දේශනාවට ඇතුළත් – පුද්ගල විමුක්තිය සලසන පිළිවෙත විග්‍රහ කැරෙන ලිපියකි.

## සමාජය ප්‍රියමනාප තැනක් කළ හැකි පියවර

– අලුත්වැව සෝරත නා හිමි

බුදු දහමේ සුවිශේෂ ඉගැන්වීමක් වූ ‘තමන් උපමා කොට අනුන් ගැන සැලකීමේ’ සංකල්පය පදනම් කරගත් අහිංසා පිළිවෙත පිළිබඳ දෙසූ බුදු වදනකට අර්ථකථනයක්, ඇසළ පසළොස්වක පෝද ධර්ම දේශනාවෙන්.

## සෝමාවතිය

– පහමුණේ සුමංගල හිමි

ඓතිහාසික – සුප්‍රකට පුද බිමක් වන පොළොන්නරුව ප්‍රදේශයේ සෝමාවතී චෛත්‍යය වෙත සූර්ය බලශක්තියෙන් සැපයෙන නව විදුලිබල පද්ධතියක් ලබාදීම නිමිති කරගෙන ලියැවෙන එහි ඓතිහාසික තොරතුරු ද ඇතුළත් ලිපියකි.

## "Ayam Vassana Kalo"

*-by Ven. Dr. P. Gnanarama Thera Principal Buddhist and Pali College of Singapore*